සැ. යු.- 2012.05.04 දින පළ වූ අංක 1757 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,758 - 2012 මැයි මස 11 වැනි සිකුරාදා - 2012.05.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 627 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


587 - B 80609 — 8,955 (2012/05)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූනි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අප්‍රේල් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අම්පාර | කල්මුණ මුස්ලිම් | මරදමුන කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

05-167

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූනි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අප්‍රේල් මස 17 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතලේ | උකුවෙල | මාතලේ දකුණ කොට්ඨාසයේ වරකාමුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

05-168

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූනි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අප්‍රේල් මස 17 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | මැදදුම්බර | උඩසියපත්තුව උතුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා උඩදුම්බර විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

05-169

## ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාව

### ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

1. (අ) *වෘත්තීන්/අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්* :

(1) *විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්* —

(අ) විදුලි පණිවුඩ යන්ත්‍ර ශිල්පි/ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (නිත්‍ය- පිරිමි - අවිවාහක/විවාහක)

* වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු (02) ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික්ස්/ ඉලෙක්ට්‍රිකල්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්ස්/ඉලෙක්ට්‍රිකල් පාඨමාලා සහතිකයක් තිබිය යුතුය.

* තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් මත නායක ගුවන්භට නිලයට බඳවාගනු ලැබේ.

(2) *වෛද්‍ය වෘත්තීන්*—

(අ) හෙද - ස්වේච්ඡා (කාන්තා - අවිවාහක)

* සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන වසර තුනක (3) හෙද පුහුණු පාඨමාලාව හදාරා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ අයදුම්කාරියන් බඳවා ගනු ලැබේ.

* තෝරාගනු ලබන අයදුම්කාරියන් ඔවුන්ගේ සුදුසුකම් මත කෝප්‍රල් නිලයට බඳවාගනු ලැබේ.

(ආ) *හෙද සහායක - ස්වේච්ඡා (පිරිමි/අවිවාහක/විවාහක)- (කාන්තා - විවාහක)*

* සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ රජයේ පිළිගත් පෞද්ගලික හෙද විද්‍යාලක අවම වශයෙන් වසරක (1) හෙද පුහුණු පාඨමාලාවක් හදාරන ලද, අයදුම්කරුවන්/අයදුම්කාරියන් බඳවා ගනු ලැබේ.

* තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් ඔවුන්ගේ සුදුසුකම් මත නායක ගුවන්භට/නායක ගුවන් කාන්තා නිලයට බඳවාගනු ලැබේ.

(ආ) *අනෙකුත් සුදුසුකම්.*- ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි. :—

(1) *පුරවැසිභාවය* : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(2) *වයස* : 2012 ජූනි මස 30 දිනට—
විදුලි පණිවුඩ යන්ත්‍ර ශිල්පී/ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (අවුරුදු 18-28 අතර විය යුතුයි)
හෙද සහායක - (පිරිමි අවුරුදු 18-28 සහ කාන්තා අවුරුදු 18-25 ත් අතර විය යුතුයි).

(3) *උස* - නිත්‍ය (පිරිමි) - අඩි 5 අඟල් 5 ට නොඅඩු
ස්වේච්ඡා (පිරිමි) - අඩි 5 අඟල් 4 ට නොඅඩු
ස්වේච්ඡා (කාන්තා) - අඩි 5 අඟල් 3 ට නොඅඩු.

(4) බර : ශරීර ස්කන්ධ දර්ශකය ගුවන් හමුදා ශාරීරික නිපුණතා පරීක්ෂණ ප්‍රමිතියට අදාළව විය යුතුයි.
19 < ශරීර ස්කන්ධ දර්ශකය < 25
ශරීර ස්කන්ධ දර්ශකය = බර (කි. ග්‍රෑ.) / උස $^2$ (සෙ. මී.)

(5) පපුව : අඟල් $32^{11}$ හුස්ම පිටකර (පිරිමි)

(6) *වර්ණ දෘෂ්ටිය* - සීපී 2

(7) *දෘෂ්ටි තීක්ෂණත්වය* : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිත/රහිත)

(8) සිවිල් තත්ත්වය : අවිවාහක/විවාහක
නිත්‍ය - පිරිමි - අවිවාහක/විවාහක
ස්වේච්ඡා - පිරිමි - අවිවාහක/විවාහක
කාන්තා - අවිවාහක
අවිවාහක ගුවන් කාන්තාවන් මූලික පුහුණු පාඨමාලාවෙන් පසු වසර 3 ක කාලයක් ගත වනතුරුත්, අවිවාහක ගුවන් භටයින් මූලික පුහුණු පාඨමාලාවෙන් පසු වසර 1 ක කාලයක් ගත වනතුරුත් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

2. පළමුවැනි ඡේදයෙහි "අ" හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ "ආ" හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර හා ඇස් පරීක්‍ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/අයදුම්කාරියකගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

3. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. *සේවා කොන්දේසි :*

(අ) ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුණුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන්භටයන්ට/ ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුව ලබා දෙන අතර ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශ රටක දී ඉටුකළ යුතුය.

5. *බඳවා ගැනීමේ කොන්දේසි :*

***නිත්‍ය - (පිරිමි)***

තෝරාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය ගුවන් හමුදාවේ තෙවන ශ්‍රේණියේ නායක ගුවන්භට නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12 ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04 ක් නිත්‍ය උපසේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට අවස්ථාව ලබාදෙනු ඇත.

*ස්වේච්ඡා (පිරිමි/කාන්තා)*

තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තෙවන ශ්‍රේණියේ නායක ගුවන්භට/නායක ගුවන් කාන්තා සහ කෝප්‍රල් යන නිලයන්ට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 5 ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05 සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

6. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් :*

තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

7. වැටුප් හා දීමනා :

(අ) වසරකට ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අදාල ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.

ගුවන්භට/ගුවන් කාන්තා රු. 1,68,000 - 6 x 1,440 - 19 x 1,800 - රු. 2,10,840 වාර්ෂිකව
නායක ගුවන්භට/ගුවන් කාන්තා රු. 1,70,880 - 4 x 1,440 - 19 x 1,800 - රු. 2,10,840 වාර්ෂිකව
කෝප්‍රල් රු. 1,75,200 - 1 x 1,440 - 10 x 1,800 - 9 x 2,520 රු. 2,17,320 වාර්ෂිකව
සැරයන් රු. 1,80,240- 3 x 1,800 - 9 x 2,520 - 3 x 3,480 - රු. 2,18,760 වාර්ෂිකව
බලපත්‍ති සැරයන් රු. 1,83,120 - 10 x 2,520 - 3 x 3,480 - රු. 2,18,760 වාර්ෂිකව
බලලත් නිලධාරීන් රු. 1,90,680 - 07 x 2,520 - 17 x 3,480 - රු. 2,67,480 වාර්ෂිකව
ප්‍රධාන බලලත් නිලධාරීන් රු. 2,11,800 - 13 x 3,480 - රු. 2,57,040 වාර්ෂිකව

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. ගුවන්භටයින්ගේ/ගුවන් කාන්තාවන්ගේ සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටුවනු ලැබේ.

(ආ) අනෙකුත් දීමනා :

(1) *ජීවනාධාර දීමනාව* මසකට රු. 5,850 ක් ගෙවනු ලැබේ;
(2) *දුෂ්කර දීමනා* මසකට රු. 600 ක් ගෙවනු ලැබේ;
(3) *ක්‍රියාන්විත සේවයේ* සේවය කරන්නන්හට මසකට රු. 4,500 ක් ගෙවනු ලැබේ;
(4) *විශේෂ දීමනාව* : මසකට රු. 2,400 ක් ගෙවනු ලැබේ. (රාජකාරී දිනකට රු. 80 බැගින්);
(5) *දිරි දීමනා* : සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු.850 දක්වා).
(6) *විශේෂ දීමනාව* : II මූලික වැටුපෙන් 15% ගෙවනු ලැබේ.
(7) *ආහාර දීමනා* : පිටත වාසය කරන ගුවන්භටයින්ට/ කාන්තාවන්ට මසකට රු.12,235.20 බැගින් ගෙවනු ලැබේ. (කඳවුරු තුළ වාසය කරන ගුවන්භටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.).

(8) නේවාසික පහසුකම් : කඳවුරු තුල වාසය කරන ගුවන්භටයින්ට/කාන්තාවන්ට නොමිලේ සපයනු ලැබේ.

(9) ගමනාගමනය : වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන්භටයා/ගුවන්කාන්තාව, භාර්යාව/ස්වාමිපුරුෂයා සහ ළමයින්ට අදාල පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(10) වික්ෂේපණ දීමනා : මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(11) සුදුසුකම් වැටුප් :- ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(12) යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා: මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු.204.00 දක්වා)

(13) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව : මසකට රු.170 ක් ගෙවනු ලැබේ.

(14) නැවත සේවයට බැඳීමේ වැටුප් : නැවත සේවයට බැඳෙන නිත්‍ය ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(15) වෛද්‍ය පහසුකම් : ගුවන් හමුදාව මගින් සෑම ගුවන් භටයකුටම/ගුවන් කාන්තාවකට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(16) කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් භටයින්/කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(17) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුළී දීමනාවක් හිමිවේ.

(18) උපදේශක දීමනාව :- මසකට රු. 425.00 සිට රු. 510.00 දක්වා දීමනාවක් හිමිවේ.

(19) වෙනත් දීමනා : (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(20) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්භටයින් දායක විය යුතුයි. අරමුදලට ගෙවි යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

8. අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි.

(ආ) රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමග තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරික්‍ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්‍ෂක විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි. :

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.);

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික;

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය;

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

9. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ඔවුන්ගේ ම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණ පිරිමි අයදුම්කරුවන්ට 2012 මැයි මස 14 සහ 15 වන දිනවල පෙ.ව. 9.0 පැයේ සිට ප.ව. 13.0 පැය දක්වා ද, කාන්තා අයදුම්කාරියන්ට 2012 මැයි මස 16 සහ 17 යන දිනවල පෙ.ව. 9.0 පැයේ සිට ප.ව. 1300 පැය දක්වා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෘත්තීය පුහුණු පාසැල ඒකළ කඳවුරේදී පැවැත්වේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු වල අගය අනුව අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටය.

12. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට/ඇයට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

13. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

එච්. ඩී. අබේවික්‍රම,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් ඉඳුරාම බඳවා ගැනීම සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම :—————.
(ජාතික හැඳුනුම්පතට අනුව)
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :—————.
4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :—————.
5. ස්ථිර ලිපිනය :—————.
6. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.
7. දිස්ත්‍රික්කය :—————.
8. මැතිවරණ කොට්ඨාසය :—————.
9. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :—————.
10. දුරකථන අංකය :—————.
11. උපන් දිනය :—————.
12. විවාහක/අවිවාහක බව :—————.
13. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
14. උස ඃ අඩි :———. අඟල් :———.
15. අ.පො.ස. (සා./පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

16. අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

17. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :—————.

18. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ඨතා පිළිබඳ විස්තර :—————.

19. පාසලේදී හෝ බාහිර සංවිධානවලදී ලබා ඇති වෙනත් විශිෂ්ඨතා :—————.

20. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :—————.

21. සිවිල් හෝ යුද්ධ අධිකරණයේදී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේද ? :—————.
එසේ නම් විස්තර සඳහන් කරන්න. :—————.

22. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

*ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ*

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ ඔහුට/ඇයට අදාල වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන

දිනය :—————.

05-248

---

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව — බස්නාහිර පළාත**

**තනතුරු පුරප්පාඩු පිරවීම**

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අඛණ්ඩ වසර 03ක කාලය තුළ ස්ථිර පදිංචියක් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01. | වෝර්ඩ්න් | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 02. | උප වෝර්ඩ්න් | - | (පුරුෂ) |
| 03. | සහකාර නිවාසාචාර්ය | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 04. | නිවාසමාතා | - | (ස්ත්‍රී) |
| 05. | ඕවර්සියර් | - | (පුරුෂ) |
| 06. | සහකාර මේට්‍රන් | - | (ස්ත්‍රී) |
| 07. | අරක්කැමි | - | (ස්ත්‍රී) |
| 08. | මුරකරු | - | (පුරුෂ) |
| 09. | කාර්යාල කම්කරු | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 10. | සනීපාරක්ෂක කම්කරු | - | (ස්ත්‍රී/පුරුෂ) |

01. *සේවා කොන්දේසි :*

1.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

1.2 තෝරාගනු ලබන අපේක්ෂකයා තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ඇත. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කරනු ලැබූ අපේක්ෂකයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු එක් අවුරුදු වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

1.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කළ යුතු ය.

1.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස රා. ප. ච. 07/2007 මගින් පනවන ලද විධිවිධානවලට ද ඉදිරියේ දී පනවනු ලබන විධිවිධාන වලට ද යටත් විය යුතු ය.

02. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

අයදුම්කරුවන් තම අයදුම්පත පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් සකස් කර අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිරවිය යුතු ය. ඉල්ලුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යයෙන්ම විය යුතු ය.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් "කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට 2012.05.25 වැනි දිනට පෙර එවිය යුතු ය. ලිපිකවරයේ වම්පස ඉහල කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කල යුතු ය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු ය.

අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ පිළිබඳ වගකීම අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සුදුසුකම් සම්පූර්ණ කරනු අයදුම්කරුවන්ගෙන් ලැබෙන අයදුම්පත් අනුව ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර සම්පූර්ණ කල යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරනු ලැබේ. 1-6 දක්වා තනතුරු සඳහා පමණක් පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබුණහොත් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යාංශය විසින් හෝ බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යාංශය විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රථිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර අදාල පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරනු ලැබේ.

04. *ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය :*

මෙම තනතුරු අතිශයින් සංවේදිව කටයුතු කල යුතු ළමයින්ගේ චර්යා පාලනයට සෘජුව අදාල වන තනතුරු වේ. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. (ලකුණු 100). ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගත්තා වූද, බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූද, අපේක්ෂකයින් පමණක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. (ලකුණු ලබා දීමේ ක්‍රමය බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශය විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ දී අනුමත කරනු ලැබේ.) ඉහත 7.5.1 හා 7.5.2 ඡේදවල සඳහන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්, මෙම තනතුරට අදාල රාජකාරි ඉටු කිරීමට ඇති හැකියාව පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඉල්ලුම්කරුගෙන් විමසා නිශ්චිත ලකුණු ප්‍රමාණයක් දිය යුතු ය. තිදෙනෙකුට නොඅඩු ළමා හිමිකම්/අයිතීන්, ළමයින්ගේ මානසික තත්ත්වය හා රැකවරණය පිළිබඳ අත්දැකීම් හා ගැඹුරු දැනුමක් ඇති විද්වත් මණ්ඩලයක් බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශය විසින් පත්කොට ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතු ය. පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරියා විසින් ලකුණු ලබා දීමක් සිදු නොකල යුතු අතර අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය හා සහතික පරීක්ෂා කිරීමේ කාර්යයේ පමණක් නිරත විය යුතු ය.

05. විභාග ගාස්තු රු. 350 කි. මෙම විභාග ගාස්තු පළාත් ආදායම් ශීර්ෂ 20-03-90-01ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතට අමුණා එවිය යුතු ය. මෙසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇනවුම් භාර ගනු නොලබන අතර, කවර හෝ කරුණක් නිසා විභාගයට පෙනී නොසිටින හෝ අයදුම්පත් ඉවත් කර ගන්නා අයදුම්කරුවන්ට හා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොමැති බව හෙළිවන අයදුම්කරුවන්ට විභාග ගාස්තු සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙනත් විභාගයක් වෙනුවෙන් පැවරීමට ද නොහැකිය.

06. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, කාන්තා කටයුතු පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය විසින් පනවනු ලබන නීතිරීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් අපේක්ෂකයින් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, කාන්තා කටයුතු පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය විසින් පනවනු ලැබිය හැකි ඕනෑම දඬුවමකට යටත් වේ.

07. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, කාන්තා කටයුතු පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

08. ඉහත තනතුරු සඳහා රා. ප. ච. 06/2006 යටතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිවල සඳහන් කොන්දේසිවලට, තෝරා ගනු ලබන අයදුම්කරුවන්, එම පරිපාටි ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන දින සිට යටත් විය යුතු ය.

09. වැටුප් පරිමාණය, වයස් සීමාව හා බඳවා ගැනීමේ සුදුසුකම් :

9.1 වෝර්ඩන් :

වැටුප් පරිමාණය - රු. 13,120-10x145-11x170-10x240-10x320-22,040-MN-1-2006A- (23 වන පියවර)

*වයස් සීමාව* - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 40ට නොවැඩි විය යුතු ය.
(දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම් -*

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම;

සහ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව, සමාජ වැඩ, මනෝවිද්‍යාව, මානව විද්‍යාව, සමාජඅධ්‍යයනය, සමාජ සංඛ්‍යානය, සංවර්ධන අධ්‍යාපනය, ජනගහන විද්‍යාව, සාමය හා ගැටුම් නිරාකරණය යන විෂයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුලත්ව සාමාන්‍ය/විශේෂ උපාධියක් ලබා තිබීම

සහ

ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයෙන් පිරි නමනු ලබන සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාවක් තිබීම.

**විභාග විෂය නිර්දේශය**

කාලය පැය 02
ප්‍රශ්න පත්‍ර - 01

* ශ්‍රී ලංකාවේ බාලාපචාරයන්හි ප්‍රවනතාවය, බාලාපචාර වැලැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග, ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳ සාමාන්‍ය දැනුම

* ළමා වර්ධනය, යොවුන් වියේ ගැටළු හා අවශ්‍යතා, කාර්යාල කළමණාකරනය පිළිබඳ සාමාන්‍ය අවබෝධය, නායකත්ව කුසලතා, සංවිධානයක කණ්ඩායම් හා පුද්ගල හැසිරීම, ආයතනික රැකවරණය, වාර්තාකරණය යන ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුම.

9.2 උප වෝර්ඩන් :

*වැටුප් පරිමාණය* - රු. 13,120-10x145-11x170-10x240-10x320-රු. 22,040- එම්එන්-1-2006ඒ

*වයස් සීමාව* - අයඳුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 40ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

අධ්‍යාපන සුදුසුකම් -

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම ;

සහ

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ, ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානවල වසර 03කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.

**විභාග විෂය නිර්දේශය**

එක් ප්‍රශ්න පත්‍රයකි. කාලය - පැය 2 1/2කි.
ලකුණු 100කි.

ශ්‍රී ලංකාවේ පවත්නා අර්බුධ හා ගැටළු පවුල හා ළමයාට බලපා ඇති ආකාරය, ළමා අපචාර ඇති වීමට හේතු හා ඒවා වැලැක්වීම සඳහා ගතහැකි පියවර පිළිබඳ සාමාන්‍ය දැනීම ප්‍රශ්න තුළින් විමසා බැලීම.

කණ්ඩායම් සාමාජිකයකු සේ වැඩ කිරීම, කණ්ඩායම් නායකත්වය, ආයතනික ව්‍යුහය, ආයතනික රැකවරණය, වැඩ පැවරීම, ළමා හා යෞවන අවශ්‍යතා, වාර්තාකරණය යන අංශ පිළිබඳ විෂය දැනුම මැන බැලීම.

9.3 සහකාර නිවාසාචාර්ය ：

*වැටුප් පරිමාණය* -රු. 13,120-10x145-11x170-10x240-10x320-රු. 22,040- එම්එන්-1-2006ඒ

*වයස් සීමාව* - අයඳුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 40ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

අධ්‍යාපන සුදුසුකම් ：

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම ;

*සහ*

ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයෙන් පිරි නමනු ලබන සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාවක් තිබීම.;

*හෝ*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව, සමාජ වැඩ, මනෝ විද්‍යාව, මානව විද්‍යාව, සමාජ අධ්‍යයනය, සමාජ සංඛ්‍යානය, සංවර්ධන අධ්‍යාපනය, ජනගහන විද්‍යාව, සාමය හා ගැටුම් නිරාකරණය, යන විෂයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුලත්ව සාමාන්‍ය/විශේෂ උපාධියක් ලබා තිබීම.

**විභාග විෂය නිර්දේශය**

ප්‍රශ්න පත්‍ර 02කි.

1. අභියෝග්‍යතාව සහ බුද්ධි පරීක්ෂණය
   කාලය පැය 01
   ලකුණු - 100 කි.

   අපේක්ෂකයාගේ භාෂා හැකියාව තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

2. සාමාන්‍ය දැනීම
   කාලය පැය 01
   ලකුණු - 100 කි.

ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

9.4 නිවාසමාතා ：

වැටුප් පරිමාණය -රු. 13,120-10x145-11x170-10x240-10x320-රු.22,040- එම්එන්-1-2006ඒ

වයස් සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 40ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම්.-*

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම;

*සහ*

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානවල වසර 03කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.

**විභාග විෂය නිර්දේශය :**

බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.
කාලය පැය - 1 1/2
ලකුණු - 100
ළදරුවන්ට හා ළමුන්ට වැළදෙන රෝග, සරල ප්‍රථමාධාර, එම රෝග වලක්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු සෞඛ්‍යාරක්‍ෂක ක්‍රම.
ළදරු හා ළමා වියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හා ආහාර ලබාදීමේ දී අනුගමනය කල යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම.
ළදරු සහ ළමා වියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කලයුතු හා නොකල යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම.

9.5 ඕවර්සියර් :

*වැටුප් පරිමාණය.* -රු. 13,120-10x145-11x170-10x240-10x320-රු. 22,040- එම්එන්-1-2006ඒ

*වයස් සීමාව* - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතු ය.

(දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම් -*

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම;

*සහ*

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානවල වසර 03කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.

විභාග විෂය නිර්දේශය :

එක් ප්‍රශ්න පත්‍රයකි
කාලය පැය - 1 1/2
ලකුණු - 100

ළමුන් සමඟ කටයුතු කිරීමේ දී ඇති විය හැකි සිද්ධි ඇසුරින් වූ බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත එක් ප්‍රශ්න පත්‍රයක් මගින් පහත සඳහන් කරුණු පිළිබඳව සාමාන්‍ය දැනීම හා අවස්ථානුකූලව ක්‍රියා කිරීමේ හැකියාව මැන බලනු ලැබේ.

(i) කණ්ඩායමක් සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව.

(ii) නිශ්චිත කාර්යයක් සඳහා තමන් වෙත පවරනු ලබන ළමුන්ගේ අත්භාරය හා ආරක්‍ෂාව පිළිබඳ කටයුතු කිරීමේ හැකියාව.

9.6 සහකාර මේට්‍රන් :

*වැටුප් පරිමාණය* - රු. 13,120-10x145-11x170-10x240-10x320-රු.22,040- එම්එන්-1-2006ඒ

*වයස් සීමාව* - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 40ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම්.—*

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම;

*සහ*

1. දෙහිවල බහු තාක්‍ෂණික ආයතනයේ ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳව එක් වසරක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

*හෝ*

2. ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වනු ලබන සූප ශාස්ත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම;

*හෝ*

3. බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ, ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානවල වසර 03කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.

**විභාග විෂය නිර්දේශය :**

ප්‍රශ්න පත්‍ර 02කි.

1. අභියෝග්‍යතාව සහ බුද්ධි පරීක්‍ෂණය
   කාලය පැය 01
   ලකුණු - 100 කි.

   අපේක්‍ෂකයාගේ භාෂා හැකියාව තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්‍ෂා කිරීම සඳහා සකස් වූවකි.

2. සාමාන්‍ය දැනීම
   කාලය පැය 01
   ලකුණු - 100 කි.

ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

9.7 අරක්කැමි :

*වැටුප් පරිමාණය.*—රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600- පීඑල්-2-2006ඒ

*වයස් සීමාව:*—අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

අධ්‍යාපන සුදුසුකම් :—

අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමල භාෂාව, ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 03ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05ක් එක්වර සමත්ව තිබීම.

9.8 මුරකරු :

*වැටුප් පරිමාණය.*—රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600- පීඑල්1-2006ඒ

*වයස් සීමාව .*— අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම් :*
අ. පො. ස. (සා. පෙළ) විභාගය එක් වරක දී විෂයයන් 06කට නොඅඩුව සම්මාන සාමාර්ථ 02ක් සහිතව සමත්වී තිබිය යුතු ය.

9.9 කාර්යාල කම්කරු :

*වැටුප් පරිමාණය.*—රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600- පීඑල්1-2006ඒ

*වයස් සීමාව.*—අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම්.*—අ. පො. ස. (සා. පෙළ) විභාගය එක් වරක දී විෂයයන් 06කට නොඅඩුව සම්මාන සමාර්ථ 02 සහිතව සමත් වී තිබිය යුතුය.

9.10 සනීපාරක්ෂක කම්කරු :

*වැටුප් පරිමාණය.*—රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600- පීඑල්1-2006ඒ

*වයස් සීමාව.*—අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

අධ්‍යාපන සුදුසුකම් *:*

අ. පො. ස. (සා. පෙළ) විභාගය එක් වරකදී විෂයයන් 06කට නොඅඩුව සම්මාන සමාර්ථ 02 ක් සහිතව සමත්වී තිබිය යුතු ය.

**ආදර්ශ අයදුම්පත**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ii) සම්පූර්ණ නම :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් නම් ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුයි. ලිපිනයේ වෙනසක් ඇත්නම් එය වහාම දැන්විය යුතුයි.)

04. ස්ථිර ලිපිනය :————.

05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී ☐ පුරුෂ ☐

07. විවාහක/අවිවාහක බව විවාහක ☐ අවිවාහක ☐

08. විභාගයට පෙනී සිටින මාධ්‍යය :————.
සිංහල/දෙමළ/ඉංග්‍රීසි

09. උපන් දිනය ඃ
(i) 2012.05.25 වැනි දිනට වයස අවු. ……මාස ……දින……
(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචියෙන් ද ?

10. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඃ
(i) අ. පො. ස. (සා. පෙළ.) :

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01. | ………… | …… | 06. | ………… | …… |
| 02. | ………… | …… | 07. | ………… | …… |
| 03. | ………… | …… | 08. | ………… | …… |
| 04. | ………… | …… | 09. | ………… | …… |
| 05. | ………… | …… | 10. | ………… | …… |

(ii). අ. පො. ස. (උ. පෙළ) :

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01. | ………… | …… | 03. | ………… | …… |
| 02. | ………… | …… | 04. | ………… | …… |

(iii) ලබා ඇති උපාධිය :————.
(iv) උපාධියට හදාරා ඇති විෂයයන් :————.
(v) උපාධිය වලංගු දිනය :————.
(vi) උපාධිය ලබාගත් විශ්ව විද්‍යාලය :————.

10. අනිකුත් සුදුසුකම් :————.

11. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :————.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය හා දිනය :————.

13. ලදුපත ගෙවූ කාර්යාලය :————.

| |
|---|
| ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන ලෙස අලවන්න. |

14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳව කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම දෙපාර්තමේන්තුවේ ........................... වශයෙන් සේවය කරන ........................... මහතාගේ සේවා වාර්තාව සම්බන්ධ ඉහත සඳහන් විස්තර පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්‍ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවට පෞද්ගලිකව සෑහීමකට පත්වන බවත්,

16. නිලධාරියාගේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත් විනය දඬුවම් ලබා නොමැති බවත්, (විනය දඬුවම් ලබා ඇත්නම් විස්තර සඳහන් කරන්න.)

17. විභාග ගාස්තු සඳහා අංක ............... හා ...............දිනැති ලදුපත අමුණා ඇති බවත්, ඔහු සේවා කාලය තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, ඔහු .................. දින සිට තනතුරට පත්ව ඇති බවත්, ............ දිනට එම තනතුරේ වසර ......... ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු තෝරා ගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරින් නිදහස් කල හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

ජී. පී. ඩී. සෝමරත්න,
කොමසාරිස්,
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත.

05-227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.